
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ බිනර අව අටවක පෝදා 2022 සැප්තැම්බර් 17 සෙනසුරාදා BUDUSARANA SATURDAY SEPTEMBER 17, 2022

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 14 පත්‍රය, පිටු 10 ආරම්භය 1965-06-13



නාමසිද්ධි ජාතක කතාව ඇසුරිනි



# සිත කිලිටි කර ගන්න එපා

# ඔබ කළ පින් නිතර සිහිකරන්න

**දුටුගැමුණු මහ රජතුමා රාජ්‍ය කරන කාලයේ කොටසර පියන්ගලු විහාරයේ වැඩ සිටියා මහලු තෙරනමක්. රට පුරා පැතිර ගියා අරුම පුදුම දාගැබක් අනුරාධපුරයේ ඉදිවෙන පුවත.**

මුදල් නොගෙන සේවය කරන්න බැරි බවත්, දාගැබට අවශ්‍ය ද්‍රව්‍ය නොමිලයේ සැපයීමට ඉඩ නැතිබවත් ආරංචි වුණා.

දවසක් පියන්ගලු විහාරයේ මහලු භික්ෂුව විහාර මලුවට වැඩම කරලා ''දැන් මා මහලුයි. ඇවිද ගන්නත් අමාරුයි. අද හෝ හෙට හෝ ජීවිතයේ අවසානය සිදු වෙන්න පුළුවන්. දාගැබට ගඩොලක් පූජා කර ගන්න තියනවා නම්, මා ලබන ලොකු භාග්‍යයක්. කොහොම හරි ඒ පිනත් කර ගන්න ඕනෑ" කියලා කල්පනා කළා.

උන්වහන්සේට මතක් වුණා තමන් හඳුනන උළු වඩුවෙක් අනුරාධපුරයේ මහ දාගැබේ වැඩ කරන බව. ඔහු හමුවෙන්න ගිහින් දාගැබට ගන්නා ගඩොළුවල දිග, පළල සහ ඝනකම අධ්‍යයනය කළා. නැවත විහාරයට වැඩම කර ගැළපෙන පස් සොයා ගත්තා. ගල් බොරළු ඉවත් කර මැටි බවට පත් කළා. ක්‍රමයෙන් සකසා ගත් අච්චුවේ බහා ගඩොළු කිහිපයක් ම හදා ගත්තා. දවස් කිහිපයක් ම වියැළෙන්නට හැරියා.

දර සොයා ගෙන පුලුස්සා ගත්තා. භික්ෂූන් වහන්සේට දැන් බොහොම සතුටුයි. ''මගේ දහඩිය හෙළලා, දෑතින් ම සකස් කර ගත් ගඩොළක් කෙසේ හෝ දාගැබට පූජා කර ගන්න අවස්ථාවක් සලසා ගන්න ඕන.

රජ්ජුරුවෝ තමන්ගේ ආරක්ෂකයින් හැම තැනම යොදවලා තියෙන්නේ. කාටවත් තමන් සකස් කළ ගඩොළක් මුදල් නොගෙන දාගැබට යොදන්න දෙන්නේ නෑ. හිතවත් උළුවඩුවාට කියලා මේ වැඩේ කර ගන්න ඕනෑ" යි කල්පනා කරලා තමන් වහන්සේ සකසා ගත් ගඩොළ පාත්‍ර පසුම්බියේ දමා ගෙන වෙහෙර මලුවට වැඩම කළා.

එතැනින් දාගැබට ගන්නා ගඩොළකට මිල දී වෙහෙර වන්දනා කරන්න යනවා වගේ එක් අතකින් මල්මිටකුත්, අනෙක් අතින් දාගැබට යොදන්න මිල දී ගත් ගඩොළත් අරගෙන උළුවඩුවන් වැඩ කරන තැනට වැඩම කළා. පාත්‍ර පසුම්බියේ තිබුණු තමන් වහන්සේගේ ගඩොළ මත මිල දී ගත් ගඩොළ තබා බාර දුන්නා.

උළුවඩුවාත් ඒවා ගෞරවයෙන් බාර ගෙන දාගැබට සම්බන්ධ කළා. ආරක්ෂකයින් මෙය දැක රජුට දැන්නුවා. වහා ම උළුවඩුවා ගෙන්වා ආරක්ෂකයින් පවසන පුවත සත්‍යය දැයි විමසුවා. ''එසේ ය, රජතුමනි, සත්‍යයි" පිළිතුරු දුන්නා.

එම ගඩොළ හඳුනනවා දැයි දෙවැනියට ප්‍රශ්න කළා. උළුවඩුවා භික්ෂූන් වහන්සේට මහත් ගෞරවයෙන් කටයුතු කරන කෙනෙක්. භික්ෂූන් වහන්සේගේ සිත රිදේවි යැයි හිතලා ''නැත ස්වාමිනි, දැන් එය හඳුනා ගන්න බෑ. නියම කර ඇති ගඩොළ වගේම එය තිබුණ නිසයි මා එය දාගැබට එකතු කළේ"යි උත්තර සැපයුවා.

'එම භික්ෂුව නැවත දුටුවහොත් ඔබට හඳුනා ගන්න පුළුවන් ද?" කියලා තුන්වැනි ප්‍රශ්නයකුත් විමසුවා. එයට පිළිතුර වුණේ පුළුවන් යන්නයි. උළුවඩුවාට එකම වචනයකින්වත් දොස් කීවේ නෑ. ඔහු දාගැබ වෙත පිටත් කළා.

රජතුමා බොහොම උපායශීලියි. මහලු ආරක්ෂකයෙක් කැඳවා ''ඔබ උළුවඩුවා වෙත රැඳී සිට භික්ෂුව හඳුනාගෙන, තොරතුරු සියල්ල දැනගෙන මට වාර්තා කරන්නැ" යි නියෝග කළා. ඔහුත් රජුගේ අණට කීකරු වී උළුවඩුවාගේ පෙන්වීමෙන් භික්ෂුව හඳුනාගෙන උන්වහන්සේ වෙත එළැඹ පාද නමස්කාර කර තොරතුරු විමසන්න පටන් ගත්තා.

''ස්වාමීනි, නුඹ වහන්සේ ආගන්තුක ද? නේවාසික ද? මම බොහෝ කලක සිට උළුගල් පිරිවෙනේ තෙරුන් වහන්සේ හඳුනනවා. අද තමයි ඔබ වහන්සේ මම දුටුවේ"යි පවසා සිටියා.

තෙරුන් වහන්සේත්, ''උපාසක ය, මම ආගන්තුක කෙනෙක්. මගේ ආරාමය කොටසර පියන්ගලු විහාරය, බොහෝ ඈත පිහිටා තියෙන්නේ."යි උත්තර දුන්නා. උපාසකයා නැවතත් ''ස්වාමිනි, නුඹ වහන්සේ දිගට ම මෙහි වැඩ සිටිනවා ද? එසේ නැත්නම් නැවත විහාරයට වඩිනවා ද?"යි විමසා සිටියා. "උපාසක ය, අසවල් දවස මම කොටසර පියන්ගලු විහාරයට පිටත්ව යනවා"යි පිළිතුරු දුන්නා.

''ස්වාමිනි, මමත් නුඹ වහන්සේ සමඟ එම්, මගේ මුල් ගම කොටසර අසවල් ගම"යි පවසා සිටියා. ''හොඳයි, එහෙනම් මාත් සමඟ යන්න සූදානම් වෙන්න" යි අවසර දුන්නා. ආරක්ෂකයා රජුට පුවත් සියල්ල දන්වා සිටියා.

''එසේ නම් ඔබත් ගමනට සූදානම් වෙන්න, භාණ්ඩාගාරයෙන් මසුරන් දහසක් වටිනා පිළිසඟළකුත්, දහසක් වටිනා අනර්ඝ පළසකුත්, පාවහන් යුගළයකුත්, සුවද තෙල් පිරෑ භාජනයකුත්, වටිනා කුඩයකුත්, භික්ෂූන් වහන්සේට අවශ්‍ය යැයි හැඟෙන තවත් පරිෂ්කාර වේ නම් ඒවාත් ඉල්ලා ගන්න"යි දන්වා සිටියා.

ආරක්ෂකයා ඒ සියල්ල අරගෙන සවස් සමයේ උළුගල් පිරිවෙනට ගොස් භික්ෂුව සමග උදෑසනින් ම කොටසර පියන්ගලු විහාරය බලා පිටත් වුණා. දින කිහිපයකින් විහාරය සමීපයට දහවල් සමය එළඹෙත් ම පැමිණියා.

භික්ෂූන් වහන්සේට බොහොම වෙහෙසයි. උන්වහන්සේ දෙපා පිරිමදිමින් වේදනාව තුනී කර ගන්න උත්සාහ ගන්න ආකාරය උපාසකයා දුටුවා.හෙතෙම සුවඳ තෙලින් පා මැඩ, උක් සකුරු සමඟ පැන් වළඳවා භික්ෂූන් වහන්සේ සමඟ කතාවට වැටුණා.

''ස්වාමිනි, මම හඳුනන භික්ෂූන් වහන්සේ නමක් වෙනුවෙන් අනුරාධපුරයෙන් පරිෂ්කාර ටිකක් මිලදී ගත්තා. උන්වහන්සේ දැන් වෙන පළාතක වැඩ සිටින බව ආරංචි වුණා. මට මේ පරිෂ්කාර ඔබ වහන්සේට පූජා කර ගන්න ඕන. ගෙදර ගිනියලා වැඩක් නෑ"යි පවසමින් පාවහන් යුගළත්, කුඩයත්, මාහැඟි පළසත් පූජා කළා.

''මගේ පුතා විවාහ වන නිසා වටිනා පිළිසඟළක් ගත්තා. ඔබ වහන්සේගේ ගුණවලට මා පැහැදුණා. සතුටු සිතින් මෙයත් පූජා කරනවා. මෙයින් සිවුරක් සකසා ගන්න ස්වාමීනි"යි පවසමින් ගෙන ආ පරිෂ්කාර සියල්ල පූජා කළා.




දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති,
අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**


නැවතත් ගමන ආරම්භ කළා. ටික දුරක් ගොස් ''ස්වාමිනි, මම මෙතැනින් ගමට යමි"යි උපාසකයා අතුරු මාර්ගයක් ළඟ නැවතී තෙරුන් වහන්සේට නමස්කාර කර සමුදුන්නා. තෙරුන් වහන්සේ අලුත් පාවහන් යුගළ පැළඳගෙන, පූජා කළ අලුත් හැරමිටිය අතැතිව, පාත්‍ර සිවුරු අතැතිව සංවර ගමනින් වඩින අයුරු බලා සිට

''ස්වාමීනි, මඳක් වැඩ සිටින්න" යි අමතා සමීපයට ගොස්

''ස්වාමීනි, මට සමාවෙන්න. රජතුමාගේ නියෝගයෙන් මම මෙහි පැමිණියේ. ඔබ වහන්සේ ම සකසා ගත් ගඩොළ මුදල් නොගෙන දාගැබට පූජා කළ නිසා, එහි බරපැන වශයෙන් මේ සියලු පරිෂ්කාර ඔබ වහන්සේට ලබා දෙන ලෙස රජතුමා දන්වා සිටියා"යි ප්‍රකාශ කළා.

ඒ බස් අසා තෙරුන් වහන්සේ මහත් සේ ශෝකයෙන් කම්පා වෙමින් ''ඇයි උපාසක ය, මා බොහෝ දුක සේ කළ පින්කමේ කුසලය උදුරා ගත්තේ, තාගේ පිරිකර තොපම අරගෙන යන්න"යි පිරිකර සියල්ල විසිකර දමා පොළොවෙහි හිඳගෙන හඬන්නට පටන් ගත්තා. බොහෝ දුකට පත් වුණා.

උපාසක උපායශීලි පුද්ගලයෙක්. තෙරුන් වහන්සේ සමීපයෙන් ම හිඳගෙන කරුණු පහදන්න පටන් ගත්තා.

''ස්වාමීනි, රජතුමා පුණ්‍ය ලෝභයෙන් අකනිටා බ්‍රහ්ම ලෝකය දක්වා උසට පාත්‍ර සිවුරු පූජා කළත්, නුඹ වහන්සේ පූජා කළ ගඩොලේ පින නුඹ වහන්සේට. ඒක රජතුමාට ගන්න බෑ.

ඒවගේම රජ්ජුරුවන් පූජා කළ පිරිකරවල පින රජ්ජුරුවන් වහන්සේට. තම තමන් කළ පින් තමන්ට ම අයත් වෙනවා මිස පැහැර ගන්න බෑ කාටවත් ම. ඔබ වහන්සේ මහත් වූ පින්කමක් කර ගත්තේ"යි සිත් සනසා තෙරුන් වහන්සේට නමස්කාර කර සමුගෙන අනුරාධපුරය බලා ඔහු පිටත්ව ගියා යි එක් කතා පුවතක සඳහන් වෙනවා.

දුටුගැමුණු රජතුමා පහන් සිතින් යුක්තව මහා දාගැබ ඉදිකළ බවත්, භික්ෂූන් වහන්සේට මහත් ගෞරවයෙන් සැලකූ බවත්, පුණ්‍ය කටයුතුවල නිතර නියැළුණු බවත්, ධාර්මික ජීවිතයක් වගේ ම ධාර්මික පාලනයක් ගෙන ගිය බවත් මේ කතා පුවතින් පෙන්වා දෙනවා. රජතුමාගේ ජීවන කතා බෞද්ධ, අබෞද්ධ සැමට ආදර්ශ සපයනවා.

ප්‍රඥාවන්තව ගැටලු විසඳා ගැනීම තෙරුවන් සරණ ගිය බෞද්ධයාගේ ලක්ෂණයක් බවයි, මෙයින් පවසා සිටින්නේ.



බත්තරමුල්ල
ශ්‍රී සුධර්මාරාම විහාරයේ
ශාස්ත්‍රපති
**කපුහේන්තුඩුවේ ඤාණසීහ හිමි**

# සමඟිය නැති තැන දියුණුව දෙදරා යයි

**අද ධර්ම දේශනාව මඟින් බුදුරජාණන් වහන්සේ සමඟිය පිළිබඳ දේශනා කළ දහම් කරුණු ස්වල්පයක් පහදා දෙන්නටයි මා බලාපොරොත්තු වන්නේ;**

සමඟිය පිළිබඳ විශේෂ අවධානයකින් බුදුරජාණන් වහන්සේ නිතර දහම් දෙසුවේ කුමන කරුණක් නිසා ද යන්න බුද්ධ කාලීන සමාජය ගැන සිතා බැලීමෙන් වටහා ගන්න පුළුවන්.

බුදුරජාණන් වහන්සේ ධම්මචේතිය සූත්‍රයේ දී මෙසේ පෙන්වා දී තිබෙනවා.

“බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණයන් සමඟ විවාද කරති. කළහ කරති. රජවරු රජවරුන් සමඟ විවාද කරති. කළහ කරති. ක්ෂත්‍රියයෝ ක්ෂත්‍රියයන් සමඟත්, පුතා මව සමඟත්, පියා පුතු සමඟත්, පුතා පියා සමඟත්, සහෝදරයා සහෝදරයා සමඟත්, සහෝදරිය සහෝදරිය සමඟත්, යහළුවන් යහළුවන් සමඟත්, වාද කරති, කළහ කරති...”

පුද්ගලයින් එකිනෙකා දබර කර ගනිමින්, ඇනකොටා ගනිමින් තිරිසනුන්ටත් වඩා පහත් ලෙස භේදව සිටි අවස්ථාවක ලොව්තුරා බුදුපියාණන් වහන්සේ, සමඟිය හෙවත් එකමුතුකම අතිශයින්ම ශ්‍රේෂ්ඨ කොට දෙසීම විප්ලවකාරී කරුණක් වුණා.

භික්ෂූන් වහන්සේ අවශ්‍යයෙන්ම සමගිව විසිය යුතු බවත්, කටයුතු කළ යුතු බවත්, එම සමඟිය උන්වහන්සේගේ යහපත පිණිස හේතු වන බවත් “සුඛා සංඝස්ස සාමග්ගී” යනුවෙන් දේශනා කළහ.

බහුජන හිතසුව පිණිස හැසිරෙන භික්ෂූන් අන් අයට ආදර්ශයක් වන ලෙස සමඟි බැම්මෙන් බැඳී ක්‍රියා කළ යුතු බව අවධාරණය කළහ. නිතරම සමඟිව රැස්ව, සමඟි සම්පන්නව කතාබහ කොට, සමඟියෙන් ම විසිර යා යුතු බව භික්ෂූන්ගේ දියුණුවට හේතු වන සප්ත අපරිහානිය ධර්ම දෙසීමේ දී බුදුරජාණන් වහන්සේ වදාරා තිබෙනවා.

භේද භින්න වූ භික්ෂූන් වහන්සේ සමඟි සම්පන්න කිරීමට යමෙක් ක්‍රියා කරත් නම් ඔහුට දිව්‍ය සම්පත් ලැබෙන බවත්, භික්ෂූන් වහන්සේලා අතර අසමඟිකම් ඇති කිරීමට යමෙක් උත්සාහවත් වේ නම්, ඔහුට අපා දුක්, වධ බන්ධන ආදියට මුහුණ පෑමට සිදුවන බවත්, අංගුත්තර නිකායේ උපාලි අසෝක වග්ගයේ දී බුදුරජාණන් වහන්සේ වදාරා තිබෙනවා.

මේ කරුණු පරීක්ෂා කිරීමෙන් අපට පෙනෙන්නේ බුදුරජාණන් වහන්සේ සමඟිය උතුම් කොට අගය කළ බවයි. වර්ණනා කළ බවයි. පාප සංකල්පය ගැන බියට පත් ගිහියන් භික්ෂූන්ගේ භේද භින්නවලට මැදිහත් වීමට බිය වුණා. එබැවින් භික්ෂූන්ගේ සමඟිය සුරක්ෂිතවීමට එය බලපෑ බැව් වැටහෙනවා.

උන්වහන්සේ ඇති කළ ශ්‍රාවක පිරිසත්, එලෙස සකස් කරන්නට දැඩි කැමැත්තක් දක්වා ඇති බව පෙනෙනවා. භික්ෂූන් වහන්සේ ගිහියන්ට ආදර්ශවත් වන අයුරින් හදාවඩා ගන්නට අවශ්‍ය නිසයි නොපැහැදුණු අයගේ පැහැදීම පිණිසත්, පැහැදුණු අයගේ පහන් බව වැඩි දියුණුවන ලෙසත්, හැසිරීමට උපදෙස් දී තිබෙන්නේ.

පින්වතුනි,

සමාජය සකස් වන්නේ සමාන සිතුම් පැතුම් ඇති පුද්ගලයන්ගෙන් ම නොවෙයි. විෂම අදහස්, විවිධ සිතුම් පැතුම් ඇති නොයෙකුත් පුද්ගලයන්ගෙනුයි. නොයෙකුත් කුණු රොඩු, අපවිත්‍ර මඩ හා ජලයෙන් යුතු එකකි පොකුණ. එහි පිවිතුරු වූ, සුන්දර වූ නෙළුම් මල් පිපෙනවා. විවිධ පුද්ගලයන්ගෙන් සමන්විත වූ නෙළුම් මලක් වගේ, මේ සමාජයේ බුදුරජාණන් වහන්සේ විරාජමාන ව බැබළුණා. ශ්‍රාවක පිරිස බැබළුණා. එමෙන්ම ඔබ හැමත් බැබළෙන්න උත්සාහ කළ යුතුයි.

අසමගිකම් බොහෝ විට හටගන්නේ අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය නොමැතිකම නිසයි. උතුම්ම නෑයා “විශ්වාසය” බව “විශ්වාසා පරමාඤාති” යන ගාථා බණ්ඩයෙන් බුදුරදුන් පෙන්වා දුන්නා. නිවසක සතුටින් ජීවත් වන ස්වාමී පුරුෂයෙක් හා බිරිඳක් අතර සමඟි බැම්ම තදින් බැඳී තිබෙනවා.

මේ දෙදෙනා අතර පිටතින් පැමිණෙන විවිධ බලවේග නිසා, නැතහොත්, ස්වාමියාගේ යුතුකම් බිරිඳට ඉටු නොවුවහොත්, සැක සංකා මතු වී, ලියලා වැඩී මහත් විනාශයක් සිදුවෙන්න පුළුවන්. එවැනි සිදුවීම් නූතන සමාජයේ ඕනෑ තරම් දැක ගන්න පුළුවන්. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, මානය වැනි පවිටු ධර්මයන් නිසා ද සමඟියට පළුදු පැමිණෙනවා.

විවිධ පුද්ගලයන්ගෙන් සමන්විත වූ සමාජයේ උන්නතිය සඳහා, සමඟි සම්පන්නව දියුණුව කරා ගමන් කිරීමට මහෝපකාරී වන, ඔවුනොවුන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍ර දේශනාව මඟින් පහදා දී තිබෙනවා. එහි සඳහන් වන යුතුකම් අන්‍යෝන්‍ය වශයෙන් ඉටු කරනවා නම් මත භේද පැනනඟින්නේ නැහැ.

මව්පියන්ගේ යුතුකම් දරුවන්ටත්, දරුවන්ගේ යුතුකම් මව්පියන්ටත්, ගුරුවරුන්ගේ යුතුකම් ශිෂ්‍යයින්ටත්, ශිෂ්‍යයින්ගේ යුතුකම් ගුරුවරුන්ටත්, ස්වාමියාගේ යුතුකම් බිරිඳටත්, බිරිඳගේ යුතුකම් ස්වාමිපුරුෂයාටත්, පාලකයන්ගේ යුතුකම් සේවකයාටත්, සේවකයන්ගේ යුතුකම් පාලකයන්ටත්, ගිහියන්ගේ යුතුකම් පැවිද්දන්ටත්, පැවිද්දන්ගේ යුතුකම් ගිහියන්ටත් අඛණ්ඩව නිසි ලෙස ඉටු කෙරෙනවා නම් නොරුස්සනා ගති හටගෙන අසමගිය පැන නඟින්නේ නැහැ.

සමඟි දාමයෙන් බැඳී, ඕනෑම උවදුරකින් ජය අත් පත් කරගන්න හැකි වෙනවා.

පුංචි මී මැස්සෝ හරිම සමඟියි. එම කුඩා සතුන් එකිනෙකා සමඟියෙන්, අනලස්ව, මල්වලින් පැණි ටික ටික ගෙනවුත් රසවත් මී වද බඳිනවා. පුංචි වේයෝ කෝටි ගණනක් එකමුතුව, පස් ටික ටික ගෙනවුත් දැවැන්ත තුඹස් බඳිනවා. සමඟි බවේ ශක්තිය කොයිතරම් මහත් ද කියන එක ඉන් අපට වැටහෙනවා. අතේ තියෙන ඇඟිලි පහම නැමුවොත් තමා හොඳ ශක්තියක් ඇතිවෙන්නේ. සුළැඟිල්ල පුංචියි කියා, ගණන් නොගෙන, නොනමා සිටියොත්, නියම ශක්තියක් ගන්න බැහැ.

රටක්, ජාතියක්, ආගමක්, දියුණු වන්නේ සමඟිය රඳා පැවතුණ තරමටයි. මතභේද හට ගත්තොත් දියුණුව දෙදරා කැඩී බිඳී පළුදු වෙනවා.

ඒ නිසා පින්වතුනි, අප අතර නොයෙකුත් හේතූන් නිසා, අසමඟිකම් හටගෙන තිබෙනවා නම්, බුද්ධිමත්ව ඒවා විසඳාගෙන සමඟියෙන් විසීමට උත්සාහ කරමු. එවිට අපේ රට, ජාතිය, ආගම රැක ගැනීම අපහසු වෙන්නේ නැහැ.

ඔබ සැමට සම්මා සම්බුදු සරණයි.



බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## බිනර අව අටවක 2022-09-17

# සැබෑ සතුට

දැනුම් තේරුම් ඇති දා සිට අප කරන කියන සෑම කටයුත්තකින් ම බලාපොරොත්තු වන්නේ සතුට ය. සැනසීම ය. . එය ළඟා කර ගැනීමේ මාර්ග පමණක් විවිධ ය. කෙනකුගෙන් කෙනකුට සාපේක්ෂ ය. කෙසේ වුවද බොහෝ පිරිසක් සැනසීමේ මඟ සොයා යමින් වැනසීමට පත්වන ආකාරය ද දුලබ නොවේ. ඒ යහපතට පිටුපා අයහපත තුළ ඉතා වේගයෙන් සැනසීම සොයා යෑමේ ප්‍රතිඵලය යි.

සම්බුදු දහම තුළ බෞද්ධයාට සතුට ළඟා කර ගන්නා ආකාරය පිළිබඳ මනා විවරණයක් ඉදිරිපත් කෙරෙයි. ධම්මපදයේ යමක වග්ගය තුළ සඳහන් කරන්නේ පින් කළ පුද්ගලයා මෙලොව සතුටු වන බව ය. පරලොව ද සතුටු වන බව ය. තමන් විසින් පින් කරන ලදැයි සිතා සතුටු වන බව ය. සුගතියට ගියේ වඩාත් සතුටු වන බව ය.

ජීවිතයට පින් රැස් කිරීමේ දී ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා ප්‍රධාන වේ. එනම් දාන, සීල, භාවනා යන පින්කම් ය. තමන් සතු දෙයක් පරිත්‍යාග කිරීම තුළ ලෝබය දුරුවේ. සිල්වත් පුද්ගලයා පස්පව් නොකරයි. ඒ තුළ ඔහු තමන්ට සේ ම අනුන්ට ද අනර්ථයක් කර නොගන්නා පුද්ගලයෙක් බවට පත්වේ. අටසිල් හි පිහිටීම, සමථ හෝ විදර්ශනා භාවනාවක නිරතවීම තුළ ද පින් රැස්වේ. සතුට උදාවේ.

එමෙන් ම ලෝබ, ද්වේෂ, මෝහ යන අකුසල මුල් මැඩපවත්වමින් , සිඳ දමමින් තමන් කළ පුණ්‍ය ක්‍රියාවන් තුළින් ලද පින් අනුන්ට අනුමෝදන් කිරීම, අනුන් කරන පින්කම් දැක සැදැහැ සිත් උපදවා ඒ පින් තමන් ද සතුටු සිතින් අනුමෝදන් වීම, ආලෝකය ලැබිය යුතු තැන්හි අඳුර දුරු කොට පහන් කිරීම, ජලය ඇවැසි තැනට ජල පහසුකම් සලසා දීම වැනි වතාවත් කිරීම පින් රැස්වෙන පින්කම් ය. අද ඇතැම් පිරිස් පුරුදු වී සිටින්නේ තමන්ගේ නිවෙසේ කැළිකසළ එක් රැස් කොට දෙනෝදාහක් දෙනා ගමන් කරන මහ පාරට හෝ ගෙන ගොස් දමා තමන් නිදහස් වන්නට ය. තමන් ගේ නිවෙසේ කුණු විසිකර දැමුවේ යැයි යම් සතුටක් ඒ මොහොතේ අත්පත් කර ගත්ත ද ඒ පසු පසින් ම දුක ඒ පුද්ගලයා හඹා එයි. පව් රැස්වෙයි. එහෙත් පින් කැමැති පුද්ගලයා සිදු කරන්නේ එසේ කැළි කසළ පිරුණු පොදු ස්ථාන පිරිසුදු කොට පිරිසුදු වටපිටාවක් ඇති කිරීම ය. ඒ තුළ බොහෝ දෙනාට සෙත සැලසෙන අතර එහි සතුට සැනසීම වතාවත් කළ පුද්ගලයාට ය.

වැඩිහිටියන්ට ගරු බුහුමන් කිරීම සේ ම, නොමඟ ගිය කෙනෙක් වේ නම් සුමඟ කියාදීම, ධර්මය නොදන්නා අයට ධර්මය දැන ගන්නට සැලසීම, සදහම් ශ්‍රවණය කිරීම, බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් පිළිබඳ ශ්‍රද්ධාවන්ත වීම, ජීවිතයේ සතුට, සැනසීම බලාපොරොත්තු වන අය විසින් අනුගමනය කළ යුතු පින් ක්‍රියාවන් ය.

බොහෝ දෙනකුට වරදින්නේ සතුට ඇත්තේ මිල මුදල් , යාන වාහන,මහා මන්දිරවන් ගේ දොර තුළ බව සිතමින් ඒවා අත්පත් කර ගන්නට හැල්මේ දිව යෑම නිසා ය. ගිහියාට අඩුපාඩුවකින් තොර සැපවත් ජීවිතයක් උදාකර ගැනීම වරදක් නැත. ඔහු ලස්සනට ජීවත්විය යුතු ය. එහෙත් ඒ සඳහා වන ගමන් මඟ යහපත් විය යුතු අතර, ජීවිතයේ යථාර්ථය අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍යය. පින් කරන්නට පෙළඹෙන්නේ, ජීවිතය අර්ථවත් වන්නේ ඒ අවබෝධය තුළ ය. අනුන්ට දුක් ගින්දර දී මොන තරම් සැප සම්පත් ලැබුණ ද, ලෝකයට පෙනෙන්නට ඒ ධනයෙන් මහා දාන මාන කළ ද ඔහු ගේ සිත දවාලන ගින්න නිවා දමන්නට මහා සාගරයක ජල කඳකට වුව ද නොහැකි ය. ඒ සිසිලස ලැබෙන්නට නම් ධර්මානුකූල මාවතට පිවිසිය යුතුම ය.

# ජාතියට ජීවය දුන් අසහාය නායකත්වය අනගාරික ධර්මපාලතුමා



**ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 158 වන ජන්මදින සැමරුම සැප්තැම්බර් මස 17 වන දිනට යෙදේ. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**

**වර්ෂ 1864 සැප්තැම්බර් මස 17 වන දින දෙන් කරෝලිස් හේවාවිතාරණ මුදලිතුමාගේ සහ මල්ලිකා හේවාවිතාරණ ළමාතැනියගේ ජ්‍යෙෂ්ඨ පුත් රුවන ලෙස ජන්මලාභය ලද අනගාරික ධර්මපාලතුමන් තත්කාලීන සමාජ සම්මතය අනුව දෙන් ඩේවිඩ් හේවාවිතාරණ යයි නම් ලැබීය.**

කෝට්ටේ ක්‍රිස්තියානි පාසල, කොටහේන ශාන්ත බෙනඩික් විද්‍යාලය, කොළඹ රාජකීය විද්‍යාලය ඇතුළු පාසල් ගණනාවක අධ්‍යාපනය ලද දොන් ඩේවිඩ් හේවාවිතාරණ තරුණයා රජයේ ලිපිකාර තනතුරක කටයුතු කරමින් සිටියදී ගෘහස්ථ ජීවිතයෙන් වෙන් වී අනගාරික ජීවිතයට ඇතුළත්ව අනගාරික ධර්මපාල යයි නම් ලැබීය.



කුඩා කල පටන් ම කොටහේන දීපදුත්තමාරාමයේ වැඩසිටි මිගෙට්ටුවත්තේ ගුණානන්ද මාහිමි, විද්‍යෝදය පිරිවෙනේ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි වැනි ශ්‍රේෂ්ඨ මහා යතිවරුන්ගේ ඇසුර ලබමින් බුදුදහම පිළිබඳ ඉගෙනීම ලද ධර්මපාල තුමන් සෙන්පති හෙන්රි ස්ටීල් ඕල්කට්තුමන් ලංකාවට පැමිණීමෙන් පසු එතුමන්ගේ කටයුතු සඳහා ද දායකත්වය දැක්වීය.

වර්ෂ 1892 අමෙරිකාවේ චිකාගෝ නුවර දෘෂ්ටි සම්මේලනයට සහභාගී වෙමින් බුදුදහම පිළිබඳ උනන්දුවක් යුරෝපීයයන් තුළ ඇති කරවීමට ධර්මපාලතුමා සමත් විය.

දඹදිව බුද්ධගයාව හින්දු භක්තික මහන්තා විසින් තම ග්‍රහණයට හසු කරගෙන තිබෙනු දුටු ධර්මපාලතුමා මහාබෝධි සංගමය පිහිටුවා විධිමත් පියවර ගනිමින් බුද්ධගයා පුදබිම ඇතුළු දඹදිව සිද්ධස්ථාන යළි බෞද්ධයන් වෙත හිමි කර දීමට කටයුතු කළේ ය.

මෙරට ජනතාවගේ ජීවන තත්වය නඟාසිටුවීමට නම් අධ්‍යාපනය සහ ආර්ථිකය දියුණු කළ යුතු බව හඳුනා ගත් ධර්මපාලතුමා ස්වකීය ධනව්‍යයෙන් බෞද්ධ පාසල් ආරම්භ කිරීමටත්, විවිධ කර්මාන්ත ආරම්භ කිරීමටත් කටයුතු කළේ ය.

රටේ විවිධ ප්‍රදේශවල මහ බෝධි සමාගම මගින් පාලනය කෙරෙන පාසල් ආරම්භ කොට ඒවායේ නඩත්තු පිණිස තම පරපුරෙන් උරුම වූ වස්තු සම්භාරයන් වෙන් කොට තැබීය. හිනිදුම පේෂකර්ම පාඨශාලාව වැනි වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථාන ඇති කිරීමත් විවිධ කර්මාන්ත පිළිබඳ පුහුණුවක් ලබා දීමට තරුණ පිරිස් වෙත ශිෂ්‍යත්ව පිරිනමා විදේශ ගත කිරීමටත් ධර්මපාලතුමා උත්සුක විය.

සෝබන මාලිගාව නම් විශේෂ රථයක නැඟී රට පුරා චාරිකාවෙහි යෙදෙමින් ලක්වාසීන් තුළ දෙස, බස, දැය, සමය යන සිවු රුවන පිළිබඳ උනන්දුවක් ඇති කරවීමටත්, දේශීය සිරිත් විරිත් අගය කරන යහපත් සමාජයක් ඇති කරවීමටත් දේශන පැවැත්වීය.

රටේ තරුණ පිරිස අතර දුසිරිත් පැතිරීම වැළැක්වීම පිණිස ලිපි ලේඛන සම්පාදනය කිරීමටත් ධර්මපාලතුමා කටයුතු කළේ ය. ත්‍රිපිටක ධර්මග්‍රන්ථයන් වෙනුවෙන් සකස් කළ අට්ඨකතා විධිමත් ලෙස සංශෝධනය කොට මුද්‍රණය කරවීම පිණිස වියත් මහ තෙරවරුන්ගේ දායකත්වය ලබමින් සිය සොහොයුරු සී. ඒ. හේවාවිතාරණ මැතිතුමා යොමු කරවන ලද්දේ ධර්මපාලතුමා විසිනි.

නිබඳ චාම් දිවි පෙවෙතක අගය දුටු ධර්මපාලතුමා ආදර්ශයෙන් ම එම පිළිවෙත් අගය කළ අයකු විය. ගවමස් කෑම, නිකරුණේ හිඳිමින් කාලය කා දැමීම, සංකර යුරෝපීය සිරිත්විරිත් අනුගමනය කිරීම වැනි කරුණු එතුමන්ගේ විවේචනයට බඳුන් වූ බව සඳහන් කළ යුතු ය.

තමන් විසින් ම ගොඩ නංවන ලද දඹදිව සාරානාත් හි මූලගන්ධකුටි විහාරයේ දී ස්වකීය ජීවිතයේ අවසාන කාල වකවානුවේ දී සිරි දේවමිත්ත ධර්මපාල නමින් පැවිදිබිමට පත් වූ අනගාරික ධර්මපාලතුමා 1933 අප්‍රේල් මස 29 වන දින අපවත් වී වදාළ සේක.

පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ සහකාර විදුහල්පති,
කොළඹ නව කෝරළය සහ නව තොටමුණේ ප්‍රධාන සංඝනායක,
**තුම්බෝවිල ධම්මරතන නාහිමි**



# දියුණුවට බාධා කරන ළාමක පිළිවෙත්ගැන දන්නවාද ?

**දීඝනිකායේ සඳහන් වන ඉතා වැදගත් සූත්‍ර ධර්මයක් වන සිඟාලෝවාද සූත්‍රය පුද්ගලයාගේ දෙලොව දියුණුව සඳහා මඟ කියා දෙන්නකි. බොහෝ සෙයින් ගෘහ ජීවිතයක් පවත්වා ගත යුත්තේ කෙසේ ද යන්න මෙයින් මනාව පිළිබිඹු වේ.**

පියාගේ අවවාද පිළිපැදීමක් වශයෙන් 'සිඟාල' නම් ගෘහ පුත්‍රයා පාන්දරින්ම නැඟිට ස්නානය කොට තෙත රෙදි හා තෙත කෙස්පිටින් සදිසා නමස්කාරයෙහි යෙදී සිටින අයුරු බුදුරජාණන් වහන්සේ දුටු සේක.

ආර්ය විනයෙහි සදිසා නමස්කාරය සිදු කරනු ලබන්නේ මෙලෙස නොවේ යැයි දේශනා කළ බුදුන් වහන්සේගෙන් සිඟාල ගෘහපති විසින් විමසනු ලබන්නේ, ඒ කෙසේදැයි කියා ය.

ඉන්පසු බුදු හිමියෝ සිඟාලෝවාද සූත්‍රය දේශනා කරමින් නිවැරැදි මඟ මැනවින් පෙන්වා දුන් සේක. ඒ අතර තුදුස් ළාමක ධර්ම වශයෙන් අපගේ දෙලොව දිවිමඟ සාර්ථක කර ගැනීමෙහිලා ඉවහල් වන කරුණු 14 ක් ද බුද්ධ දේශනාවෙහි සඳහන් වෙයි.

පුද්ගලයා පාපයෙන් තොරව නිවැරැදි, දැහැමි මාවතක් වෙත යොමු වීම මෙම තුදුස් ළාමක ධර්ම වටහාගෙන එයින් වැළකී සිටීමෙන් සිදුවෙයි. ඒ

සතර කර්ම ක්ලේශ
සතර අගති
ධන විනාශ මුඛ හය යන ඒවා ය.

## සතර කර්ම ක්ලේශ

ප්‍රාණඝාතය - පංචශීල ප්‍රතිපදාවේ පළමුවන ශික්ෂා පදය මඟින් අදහස් කරන්නේ සත්ත්ව ඝාතනයෙන් වැළකීමයි. පුද්ගලයා හැමවිටම මනුෂ්‍යයා ඇතුළු සියලු සත්ත්වයන් කෙරෙහි කරුණාවෙන්, දයාවෙන් හා අනුකම්පාවෙන් යුතුව ක්‍රියා කළ යුතු බවත් ප්‍රාණඝාතයෙන් වැළකිය යුතු බවත්, බුදුහිමියන් මනාව දේශනා කොට ඇත.

අදත්තාදානය - සොරකම හෙවත් නොදුන් දේ ගැනීම පංචශීලයෙහි දෙවැනි ශික්ෂා පදයයි. පුද්ගලයා සොරකමට යොමුවීම සමාජයේ නොයෙක් ගැටලුකාරී තත්ත්වයන් පැන නැඟීම සඳහා හේතුවක් වෙයි. මේ නිසා සෑම අයුරින්ම සමාජ පරිහානිය සිදුවන අතර, සාමකාමී ධාර්මික සමාජයක් බිහි කිරීම උදෙසා සොරකමින් වැළකීම ඉතා වැදගත් පිළිවෙතක් බව බුද්ධ දේශනාවයි.

කාමයෙහි වරදවා හැසිරීම - ගිහි දිවියක් ගත කරන පුද්ගලයා පංචකාම සම්පත් අනුභව කරයි. එහෙත් එයින් අගතියට ගොස් ක්‍රියා කිරීම පරිහානියට මඟක් බව බුදුහිමියෝ පෙන්වා දෙයි. මේ නිසා කාමයේ වරදවා හැසිරීමෙන් වෙන්වීම සාමකාමී, සදාචාර සම්පන්න සමාජයක් බිහි කිරීම සඳහා ඉතා වැදගත් වන බව බුදුදහම පෙන්වාදෙයි.

මුසාවාදය - සතර කර්ම ක්ලේශයන්හි අවසාන කරුණ වන මෙයින් පෙන්වා දෙනු ලබන්නේ බොරු කීමෙන් වැළකිය යුතු බවයි. බොරු කීම තුළින් සමාජයෙහි බොහෝ ගැටලුකාරී තත්ත්ව නිර්මාණය වන අතර, එකිනෙකා අතර ඇති සුහදතාව ද විනාශයට පත් වෙයි. මේ නිසා ඇතැම් විට ජීවිත මඟින් ද වන්දි ගෙවීමට සිදුවන අවස්ථා අපට සමාජය තුළින් දැකගත හැකි ය. තුදුස් ළාමක ධර්මයන්හි සඳහන් වන මුසාවාදයෙන් තොරවීම නිසා මිනිසා දැහැමි වන අතර, සාමකාමී සමාජයක් නිර්මාණය කිරීමට එය හේතු වෙයි.

## සතර අගති

ඡන්දය - ඡන්දය යනු කැමැත්තයි. පුද්ගලයා යමක් ලබා ගැනීම උදෙසා අගතිගාමීව ක්‍රියා කිරීමට පෙළඹීම සමාජයේ නොයෙක් ගැටලුකාරී තත්ත්වයන් නිර්මාණය කරයි. මෙය ජන ජීවිතය හා සාමකාමී බව විනාශ වීමට හේතුවන බව බුදුහිමියෝ පෙන්වා දෙති.

ද්වේශය - මෙයින් අදහස් කරන්නේ තරහව හෙවත් කේන්තියයි. මේ නිසා ජීවිතය හා දේපළ හානි බෙහෙවින් සිදුවන අතර, ද්වේශ සහගත පුද්ගලයා මුළුමහත් සමාජයට ම ගැටලුවක් වන බව මෙයින් පෙන්වා දෙයි.

භය - භය යනු බියෙන් අගතියට යාමයි. පුද්ගලයා බිය හේතු කොටගෙන අන් සත්ත්වයන්ට හිංසා පීඩා කිරීම සඳහා පෙළඹෙයි. මෙම අගතියට පැමිණීම නිසා පුද්ගලයා අයුක්තිය, අසාධාරණය හමුවේ ද ඇතැම් විට මුනිවත රකියි. සමාජ පරිහානිය සඳහා මෙය මහත් ගැටලුකාරී තත්ත්වයක් බව මෙයින් මනාව අවධාරණය වෙයි.

මෝහය - සතර අගතීන්හි අවසාන කරුණ වන මෝහය යනු මෝඩකමයි. කර්මය හා කර්ම ඵලය විශ්වාස නොකිරීම යන පැහැදිලි කිරීම මේ සඳහා බෙහෙවින් උචිත වෙයි. මෝහය නිසා පුද්ගලයා මොහොතින් මොහොත පරිහානියෙහි මඟට යොමු වන අතර, සමාජ ගැටලු සඳහා එය හේතු වෙයි.

## අපාය මුඛ

තුදුස් ළාමක ධර්ම අතර සඳහන් වන අපාය මුඛ යන වදනින් පැහැදිලි වන්නේ පුද්ගලයා පිරිහීමට හෙවත් අගතියට යොමු වන කරුණු යන්නයි. මෙයින් ඈත් වී යහමඟට යොමු වීම තුළ අර්ථවත් සදාචාර සම්පන්න. සමාජයක් බිහි කිරීමට හැකි බව බුද්ධ දේශනාව තුළ මනාව පෙන්වා දී ඇත.

රහමෙර පානය - පංචශීල ප්‍රතිපදාවෙහි අවසාන ශික්ෂා පදය වන මෙය, පුද්ගලයා අගතියට හෙවත් පිරිහීමට පත් කරන ප්‍රබල කරුණකි. වත්මන් සමාජය දෙස අවධානය යොමු කිරීමේ දී රහමෙර පානය හේතුවෙන් නොයෙක් ගැටලු පැන නැඟී ඇති අතර, ඇතැම් අය තම වටිනා ජීවිතය එයින් විනාශයට පත්කර ගනිති. සුරාවෙහි ආදීනව සිඟාලෝවාද සූත්‍රයෙහි මෙසේ සඳහන් වෙයි.

තමාගේ ධනය විනාශයට පත්වීම, කලකෝලාහලවලට යොමුවීම, විවිධ රෝගාබාධවලට ගොදුරු වීම, අපකීර්තියට පත්වීම හා නුවණ දුර්වල වීම ය.

## නොකල්හි වීථි සංචාරය

කාලය රන් හා සමානයි යන කියමනට අනුව, පුද්ගලයා තම වටිනා කාලය නිකරුණේ කඩපිල් මත හෝ මහ මඟ නිකරුණේ වැය නොකළ යුතු ය. එලෙස ජීවත් වීම මඟින් ඔහුට නොයෙක් අන්දමේ ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ පෑමට සිදුවන බව මෙම සූත්‍රය මඟින් බුදුහිමියෝ පෙන්වා දී ඇත. තමා අනාරක්ෂිතයකු වීම, තම අඹු දරුවන් ද අනාරක්ෂිත වීම, ස්වකීය වස්තුවද අනාරක්ෂිත වීම, පාප ක්‍රියාවන්හි සැක කටයුත්තකු වීම, අභූත චෝදනාවන්ට ලක්වීම හා බොහෝ කරදර හිරිහැරවලට ලක්වීම ය.

## උත්සව දර්ශනාදියෙහි ලොල් වීම

ගිහි දිවියක් හෙවත් පංච කාම භෝගී දිවි පෙවෙතක් ගත කරන පුද්ගලයාට උත්සව දර්ශනාදිය නැරැඹීම තහනමක් නොවේ. එහෙත් ඒවා කෙරෙහි දැඩිව ලොල්වීමෙන් ක්‍රියා කිරීම තුළ පරිහානියට පත්වන බව බුද්ධ දේශනා මඟින් මැනවින් පෙන්වා දී ඇත.

## දුකෙළියෙහි යෙදීම

පරිහානියට පත්වන ප්‍රබල හේතුවක් වන දුකෙළිය හෙවත් සූදුව නිසා පුද්ගලයා දිනෙන් දින විනාශය කරා ගමන් කරයි. සූදුවට ලොල් වීම තුළ ඇති ආදීනව 6 ක් සිඟාලෝවාද සූත්‍රය පෙන්වා දී ඇත.

දිනන්නා වෛරයට ලක්වෙයි
පරදින්නා ශෝකයට පත්වෙයි
දැක දැක ධනය විනාශ වෙයි
ඔහුගේ වචන පිළිගනු නොලැබෙයි
මිත්‍රාදීන්ගේ පරිභවයට ලක්වෙයි
ආවාහ විවාහාදියෙහි දී බැහැර කරයි

## පාපමිත්‍ර සේවනය

මෙලොව දිවි පෙවෙතක් ගත කරනු ලබන අප සියලු දෙනා ඇසුරට සුදුසු පරිසරයක් තෝරා ගත යුතු ය. බුදුරදුන් පෙන්වා දෙන්නේ පාප මිත්‍ර සේවනයෙන් බැහැරව කල්‍යාණ මිත්‍රයන් ඇසුරට, තෝරා ගත යුතු බවයි.

## අලසකම

පුද්ගලයා ජීවිතය ගත කළ යුත්තේ උත්සාහයෙන් හා අධිෂ්ඨානයෙනි. අලසකමින් කටයුතු කිරීම පරිහානියට හේතු වේ. උත්සාහයෙන් තොරව අලසකමින් කටයුතු කිරීම තුළ ඇති ආදීනව බුදුහිමියෝ සිඟාල ගෘහපතියාට පෙන්වාදී ඇත. මෙසේ ක්‍රියා කරන තැනැත්තාට දියුණුවක් කෙසේවත් අපේක්ෂා කළ නොහැකි බව මනාව පැහැදිලි කොට ඇත.

ඉහත සඳහන් කරන ලද තුදුස් ළාමක ධර්ම පිළිබඳ දැන සිටීම අපගේ දිවි මඟ සාර්ථක කර ගැනීම සඳහා බෙහෙවින් හේතුවෙයි. ගෘහ දිවියක් ගත කරන හැම දෙනාටම ඒවා දැන සිටීමෙන් ජීවිතයට ලැබෙන පිටිවහල ඉතා විශාල ය.


ලොවුතුරා බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රය දේශනා කිරීම මඟින් අපේක්ෂා වූයේ ද පුද්ගලයාගේ දිවි පෙවෙත සාර්ථක මඟට යොමු කිරීමයි. "උභය ලෝක විජයාය"

දෙලොව දියුණුව ඇති කර ගැනීම උදෙසා බුද්ධිමත් ඔබත් මෙම වටිනා දහම් කරුණු පිළිබඳ අවබෝධය ඔබේ වටිනා මිනිසත් බව ආලෝකවත් කර ගැනීමට උපයෝගී කර ගන්න.

ගාල්ල ශ්‍රී ලංකා ධර්මදූත මහ පිරිවෙනේ
ආචාර්ය දර්ශනපති
**කනංකේ විජිත නන්ද හිමි**

# සමන් සුරිඳු කරුණාවෙන් නමදිමු සිරිපාද පියුම්

**අප මහා බෝසතාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්ව නව මසක් ගත වූ තැන ලක්දිවට වැඩම කළ සේක.**



යක්ෂයන් දමනයට මහියංගණයට වැඩි උන්වහන්සේ දහම් දෙසූ අවස්ථාවේ දී සුමන සමන් දෙව්රජු සෝවාන් ඵලයට පත් විය. දෙව් රජු වන්දනා කිරීමට යමක් ඉල්ලා සිටි අවස්ථාවේ දී සියලු සත්ත්වයන්ට අනුකම්පාවෙන් බුදුරජාණන් වහන්සේ සම්බුදු සිරස පිරිමැද නීලවර්ණ කේශ ධාතූන් වහන්සේ මිටක් ලබා දුන් සේක.

එය රන් කරඬුවකට පිළිගත් සුමන සමන් දෙවිඳුන් ධාතූන් වහන්සේ තැම්පත් කොට ලොව ඉදි කළ මුල්ම සෑය වූ මහියංගණ සෑ රදුන් වහන්සේ ඉදි කරන ලද බව මහාවංශයේ සඳහන්ව ඇත.

භාග්‍යවතුන් වහන්සේ මෙරටට බුදු සමය හඳුන්වා දීමෙන් පසු ධර්ම විනයත්, සංස්කෘතියත් මෙරට සමාජ භාවිතයට යොදවනු ලබන්නේ සුමන සමන් නමැති ප්‍රාදේශීය පාලකතුමන් විසිනි.

'සුමන සමන්' යනු අප රටෙහි ජීවත් වූ වැසියෙකි. මාර්ගඵලලාභී ආර්ය ශ්‍රාවකයකු ලෙසින් ද, ප්‍රාදේශීය රාජ්‍ය පාලකයකු ලෙසින් ද ඔහු තමන් වැළඳගත් මේ උතුම් දහම තම රට වැසි ජනතාවට හඳුන්වාදීමට කාරුණික විය.

සමනල අඩවිය කේන්ද්‍ර කර ගත් මේ මහා රාජධානිය තුළ එම උත්තම දහම පැතිර ගියේ සුමන සමන් දෙව් සංස්කෘතිය ලෙසිනි. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණයන්ගෙන් සමන්විත මෙම සංස්කෘතිය මඟින් ගෝත්‍රික ජනතාව අතර එතෙක් පැවති මත ගැටුම්, අවි ගැටුම් නිරාකරණය කරමින් සමාජ සාමයක් ගොඩ නඟන්නට සමත් විය.

සාමය ස්ථාපිත වීමත් සමඟම ප්‍රදේශය සමෘද්ධිමත් විය. එයට නායකත්වය ලබා දෙන ලද්දේ සුමන සමන් පාලකයා විසිනි. මේ ධාර්මික පාලනය නිසාම එතුමාගේ අභාවයෙන් පසුව කෘතගුණ දත් ජනතාව එතුමා දේවත්වයෙහිලා සලකන්නට වූහ. ඒ සුමන සමන් දෙව් වන්දනාව සුමන සමන් සංස්කෘතිය බවට පත්විය.

**ධාර්මික පාලනය නිසාම එතුමාගේ අභාවයෙන් පසුව කෘතගුණ දත් ජනතාව එතුමා දේවත්වයෙහිලා සලකන්නට වූහ. ඒ සුමන සමන් දෙව් වන්දනාව සුමන සමන් සංස්කෘතිය බවට පත්විය.**

භාග්‍යවතුන් වහන්සේ තෙවැනි වර මේ ලක්දිවට වැඩි මොහොතේ සුමන සමන් දෙවිඳුන්ගේ ආරාධනාව මත සුමන කූඨයට වැඩම කොට උතුම් සිරිපා සලකුණ නිල් මාණික්‍යයක් මත පිහිට වූ බව මහාවංශයේ සඳහන් ය. භාග්‍යවතුන් වහන්සේගේ විශේෂ සැලකීමට ලක් වූ මේ දෙවිඳාණෝ සතර දිසාවට අධිපති දෙවිවරු අතර එක් දෙවියෙකි.

විෂ්ණු දෙවිඳු දෙවිනුවරට ද, විභීෂණ දෙවිඳු කැලණියට ද, කඳ සුරිඳුන් කතරගමට ද, සුමන සමන් දෙවියන් සබරගමුවට ද අධිපති දෙවිවරු ලෙස සැලකේ. ඒ දෙවිවරු අතර කරුණාව, මෛත්‍රිය, දයාව, අනුකම්පාව පිරි ප්‍රසන්න ලීලාවෙන් සුමන සමන් දෙවිඳු වැඩ වෙසෙත්.

සුමන සමන් දෙවියන්ගේ වාහනය සුදු ඇතා වන අතර, එම ඇතා තම සොඬින් නෙලුම් මලක් දරා සිටියි. එලෙසම සුමන දෙව් රජුගේ අතේ රැඳී ඇත්තේ සුදු නෙලුමකි. නෙළුම් මල පවිත්‍රතාවයේ සහ සත්‍යාවබෝධයේ සංකේතයයි. බෝසතාණන් වහන්සේගේ උපතේ සිට නෙළුම් මල බොහෝ සේ බුද්ධ ශාසනය වටා බැඳී පවතී.

## වසරක් පාසා උදාවෙන සිරිපා වන්දනාව....

සිරිපා වන්දනා වාරයත්, සුමන සමන් දෙවිඳුනුත් අතර ඇත්තේ එකම බැඳීමකි. සිරිපා සමයේ පළමුකොට ම ඓතිහාසික මහා සමන් දේව ප්‍රතිමාව,ධාතු කරඬුව හා හින්දු දේව ප්‍රතිමාව ද පෙරහරකින් මහ මලුවට වැඩමවා එහි තැම්පත් කිරීම සිදු කරයි. එම ඓතිහාසික සඳුන් මුවා මහ සමන් දේව ප්‍රතිමාව දෙවැනි පැරකුම්බා රජුගේ අගමැති දේවපතිරාජ නම් ඇමැතිවරයා විසින් ගම්පොළ දී නිර්මාණය කළ බවට විශ්වාස කළ හැකි තොරතුරු පූජාවලියේ සඳහන් වේ.

උතුම් සිරිපා වන්දනා සමය උඳුවප් පෝ දින ආරම්භ වී වෙසක් පුර පෝ දිනෙන් අවසන් වේ. මෙම කාලය තුළ සිරිපා මලුව තුළ සමන් දේව ප්‍රතිමාව සහ පූජා වස්තු තැම්පත් කර තිබේ. වන්දනා සමය අවසන් වන දින නැවතත් සමන් දේව ප්‍රතිමාව සහ පූජා වස්තු මලුවෙන් පහළට වැඩමවීම සිදුවේ. මෙම දෙව් ප්‍රතිමාව සහ පූජා වස්තු සිරිපා අවාරේ තැම්පත් කර තිබෙන්නේ පැල්මඩුල්ල කීර්ති ශ්‍රී රාජසිංහ රාජමහා විහාරයේ ය. අද වන විට එම විහාරය ශ්‍රීපාද විහාරය නමින් ව්‍යවහාරයේ පවතී.

කිසියම් වූ ශිෂ්ටාචාරයක්, සභ්‍යත්වයක්, සංස්කෘතියක් ගොඩනැඟෙන්නේ ආශ්‍රිත සමාජ පරිසරය කේන්ද්‍ර කර ගනිමිනි. සමනල අඩවිය ද, සුමන සමන් දෙව් සංස්කෘතිය හැදී වැඩී පෝෂණය වන්නට කදිම සාර භූමියක් විය.

ලක් දෙරණ සිසිල් දියෙන් තෙත් කරවන, සශ්‍රීක කරවන මහවැලි, කැලණි, කළු, වලවේ යන ගංගා සතරට ම ජල පෝෂක ප්‍රදේශය වන්නේ සිරිපා අඩවියයි. මෙම ගංගා සතර ආශ්‍රිතව ජීවත් වූ ජනතාව ද සුමන සමන් දෙව් සංස්කෘතියෙන් පෝෂණය වූවෝ වෙති.

සුමන සමන් දෙවිඳුන් ගැන වංශ කතා, ජන කතා, ඉතිහාසය මෙන් ම මුඛ පරම්පරාවෙන් එන කතා ද බොහෝමයකි. අයහපත කිරීමට යන අයකුට සුමන සමන් දෙව් අඩවියේ යහපතක් නොවන බව විශ්වාසයක් පවතී. ශ්‍රී පාද අඩවිය පිළිබඳ ද එවැනි ජනප්‍රවාද කතා බොහෝ ය.

උඩ මලුවට යන සැදැහැවතුන්ගේ විශ්මයට තුඩු දෙන ඉර සේවය, සමනලගිරි හිස සෙවණැල්ල ආදී සියල්ල ම විශ්මය ජනක ය. සම්බුදු සිරිපා පිහිටි භූමි ප්‍රමාණය වශයෙන් ගත් කල කුඩා ප්‍රදේශයකි. නමුත් කරුණා කිරීමට පැමිණෙන සැදැහැවතුන් කිසිදු පාලනයකින් තොරව වන්දනා කරති. නිතිපතා එන සියලුම පිරිස නොකඩවා මලුව දක්වා ම කරුණා කරති.

කරුණා කිරීමට කොපමණ පිරිසක් පැමිණිය ද ඒ සියලු දෙනාට ම ඉඩකඩ ලැබෙනු ඇත. මෙම පුණ්‍ය භූමිය තුළ කිසිදු හිරවීමකින්, තෙරපීමකින් කිසිවකුට අනතුරක් වූ බවට සඳහනක් නැත. ශ්‍රද්ධාවන්ත සමන් දෙවිඳුගේ කරුණාව එය විය නොහැකි ද?

**"විෂ්ණු දෙවිඳු දෙවිනුවරට ද, විභීෂණ දෙවිඳු කැලණියට ද, කඳ සුරිඳුන් කතරගමට ද, සුමන සමන් දෙවියන් සබරගමුවට ද අධිපති දෙවිවරු ලෙස සැලකේ. ඒ දෙවිවරු අතර කරුණාව, මෛත්‍රිය, දයාව, අනුකම්පාව පිරි ප්‍රසන්න ලීලාවෙන් සුමන සමන් දෙවිඳු වැඩ වෙසෙත්."**

**සමන් සුරිඳු කරුණාවෙන්**
**සමන් ගිරි හිසේ සුරැඳුණු**
**ගොයුම් පා පියුම් සතුටින්**
**කරමු වන්දනා...**

**නයනා නිල්මිණී**

# මිනිස් හදමඬල මිහිමඬලට ආශිර්වාදයක් වීමට නම්...



උදම්මිට උත්තමාරාම පුරාණ විහාරයේ
**මොරටුවේ ආනන්ද හිමි**

**සිදුහත් මහබෝසත් මාතාවෝ බෝසතාණන් වහන්සේ මව්කුස පිළිසිඳගත් අවස්ථාවේ ද පෙහෙවස් සමාදන්ව සිටියා ය.**

මවගේ සිතුම් පැතුම් සිතිවිලි ධාරාව කුස තුළ වැඩෙන දරුවාගේ කායික, මානසික වැඩීමට සෘජු ලෙසම බලපායි. එනිසාම බුද්ධිමත් ගර්භණී මාතාව දහමට නැඹුරුව බෝමලුවක් වෙතට ගොස් වතාවත් සිදු කරයි.

භාවනා කිරීම, කරණීය මෙත්ත සූත්‍රය, අංගුලිමාල පිරිත ආදී පිරිත් සූත්‍රයන් සජ්ඣායනා කිරීම මවගේ කායික මානසික නිරෝගී බවට හේතු වෙයි. එය දරුවාගේ හිතසුව පිණිස ද මහෝපකාරී වෙයි.

සමාජ හිතකාමී, ආදරය , දයාව, කරුණාව ආදි ගුණයන්ගෙන් ළතෙත් හදවතින් යුතු දරුවකු විශ්ව පවුලට ඉන් දායාද වෙයි. බුද්ධිමත් මව්පියෝ මෙම වගකීම් සහගත දෙමාපිය භූමිකාව හොඳින් දැන ඒ අනුව ක්‍රියා කරයි.

"පාපා නිවාරෙන්ති" – කල්‍යාණේ නිවේසෙන්ති"

දරුවකු පාපයෙන් වළකා යහපතෙහි යෙදවීමේ බුදුන් වහන්සේගේ පාඩම ක්‍රියාවට නැඟීම දරුවකුගේ තිඹිරිගෙය තුළදී ම ආරම්භ කළ හැකි ය. ගුණගරුක දෙමාපියන්ට, ගුණගරුක දරුවන් ම ලැබීමෙන් සමස්ත විශ්ව පවුල සුවපත් වෙයි.

එදා මිහිඳු මහ රහතන් වහන්සේගේ වැඩමවීමෙන් මිස්සක පව්වෙන් දේශය සිසාරා පැතිරුණු සදහම් මාරුතයෙන් අපේ අම්මාවරු මොනවට සැනසුනහ.

එම සදහම් සිසිලසින් මතු පරම්පරාව ද සැනසීමට පත්විය. මව් ඇකයේ නැළැවුණු සිඟිති දරු පැටවාගේ හිස පිරිමදිමින් කරුණාබර මවු මුවින් මිමිණුවේ බුදුගුණ ශාන්තියයෑ.

මුනි සිරිපා සිඹ සමනොළ ගිරි පෙදෙසින් හමන මඳ සුළඟ වැද නිදි දෙව්දුව හා සුව නින්දකට වැටෙන දරුවාගේ මනසේ දෝංකාර දෙනුයේ ශාන්තිදායක බුදුගුණ ශබ්ද තරංගයයි. එය දරුවාගේ හදමන සනහාලයි.

ටිබටයේ මහින්ද හිමිගේ දිව්‍ය මන්ත්‍රණය සදිසි දරු නැළවිලි කවි දෙව්ලොව දෙවියන් මනුලොව මිනිසුනට දුන් අමිල ත්‍යාගයන් ය. සරසවි නොගිය, උසස් අධ්‍යාපන වරම් නොලද අපේ අම්මලාගේ බුද්ධි ප්‍රභාවය මතු පරම්පරා ගණනාවක් මිනිස්කමේ දීප්තියෙන් බබළවයි.

"දොයි දොයි දොයි
දොයියය බබා
බයි බයි බයි බයිය බබා
ඔන්න බබෝ
ඇතින්නියා ගල් අරඹේ
සිටින්නියා
ගලින් ගලට පනින්නියා
බබු දැකලා දුවන්නියා"

මෙබඳු කවි ගය ගයා අපේ අම්මාවරු හඬන දරු දැරියෝ නැළවූහ. පුංචි දරු දැරියන්ගේ අයෝමය පෞරුෂ සංවර්ධනය උදෙසා මේ නැළවිලි කවිය කොතරම් උපකාරවත් දැයි විමසා බැලීම වටියි.

රටත්, ජාතියත් ආපදාපන්න වූ කල දීප්තිමත් ප්‍රදීපස්ථම්භ ලෙස නැඟී සුරුවිරුකම් පා රට දැයේ විමුක්තිදායකයන් වූ වීර මොනරවිල, කැප්පෙටිපොල අදිකාරම්තුමා, පුරන් අප්පු විරුතුමා. ගොංගාලේගොඩ බණ්ඩා විරුතුමා ආදි විරුවන් දැයට තිළිණ වූයේ ඉහත කවිවලින් අම්මාවරු සිඟිති හදේ පෞරුෂය නැංවූ නිසා ය.

ගල් අරඹේ මහා සද්දන්තයා සිඟිති පුතුට බියේ පලා යයි යන සිතිවිල්ල ළපටි හදසන්තානයට කාවැද්දීමෙන් තෙදබලැති සූර, වීර, ධීර අයෝමය හෙළ විරුවෝ දැයට බිහිවූහ.

අතට වෙරළු ඇහිඳ ගෙනේ
බරට ම දර කඩා ගෙනේ
ඉනට පලා නෙළා ගෙනේ
එයි අම්මා විගසකිනේ

අම්මා කෙනෙක් දරුවන් රකින්නට දරනා තැත, වෙහෙස මහන්සිය හා මුසුවූ දරු සෙනෙහේ දරුවන් තුළ කිඳා බැසීමෙන් මාතෘත්වයේ අගය දත්, මව්පිය ගුණ සංවේද, මනුෂ්‍යත්වයෙන් පිරිපුන් මිනිසකු නිර්මාණයට මඟ පාදයි.

"බබා මගේ හරි හපනා
දවසක කොළඹට යනවා
පනම් තිහක් පඩි කනවා
ඒ පනමේ ලුණු කනවා"

යන නැළවිල්ලෙන් කුඩා මනසට දැනෙන්නේත්, බහ තෝරන කල පටන් සිතන්නේත් තමන් හපනකු බවයි. දක්ෂ පක්ෂකම් ඇත්තකු බවයි. ධනාත්මක චින්තනය සිඟිති මනසේ මින් රැව්පිළි රැව් දෙයි.

උස්මහත් වූ දරුවා, හැදූ වැඩූ දෙමාපියන් අමතක නොකරන බව ද මින් කියැවෙයි. අර්ථය නොදැනුනත් කර්ණරසායන මිහිරියාවෙන් නැළැවෙන සිඟිත්තාගේ පෞරුෂ වර්ධනයට අම්මාවරු සිඟිති මුවකමල සිඹ සිඹ ගැයූ දරු නැළවිල්ල රන්මිණි මුතු ධන නිදාන වූයේ ය.

ලොව සෑම යහපත් දෙයක් ම බිහිවනුයේ හිරුකිරණින් හා මවගේ කිරි බින්දුවෙනි යන කීර්තිධර රුසියානු සාහිත්‍යධර මැක්සිම් ගෝර්කිගේ කියමන හුදු අතිශයෝක්තියක් නොවන බැව් සක්සුදක් සේ පැහැදිලි ය.

දවසක් බුදුරදුන් සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩවාසය කළ දිනෙක ප්‍රජාපතී රහත් භික්ෂුණීන් වහන්සේ අවුත් බුදුසිරිපා පද්මය අභියස වැඳවැටී

"බුදුපියාණෙනි, "ඔබ වහන්සේ කුඩා කල සිදුහත් බෝසත් අවධියේ මවුතුම් මායා දේවිය කලුරිය කළ පසු බෝසතුන් රැක බලා හදාවඩාගත් අම්මා මම වෙමි. ඔබ වහන්සේට මා එදා අම්මා වුව ද අප බුදුපියාණන් වහන්සේ අද අපට අම්මා කෙනෙකි. තුන්ලොවට ම බුදුඅමා මෑණියන් වහන්සේ ය." යනුවෙනි.

තිලොව අමා මෑණී වහන්සේගේ ශ්‍රී සද්ධර්ම ක්ෂීරයෙන් දරුවකු ගත සිත වඩන්නට මව්පියෝ උත්සුක වෙත් ද, කරුණාව, දයාව, මෛත්‍රිය, ඉවසීම, අධිෂ්ඨානය, සත්‍යගරුකවීම, කෙටියෙන් ම පවසතොත් පිරුණු මනුෂ්‍යත්වය කියා දෙන බුදුදහමේ හර පද්ධතිය දරුවාගේ ජීව රුධිරයට කාවද්දයි නම් ඉන් තැනෙන මිනිස් හද මඬල මිහිමඬලට ආශිර්වාදයකි.

සැබෑ පුරුෂාර්ථයන්ගෙන් සුසැදි මිනිස් කැළ මිනිස් ලොව දිව්‍ය විමානයක් කරයි. සරු අස්වැන්නකට බිම සකසන්නා සේ දෙව් විමනක් පිණිස තිඹිරිගෙය සකසන බුද්ධිමත් මව්වරුන්ගේ කාර්යභාරය සුළුපටු නොවෙයි.



# මියන්මාරයෙන් ශ්‍රී ලංකාවට මානුෂීය ආධාර






මියන්මාරයේ සිතගු බෞද්ධ විශ්වවිද්‍යාල සමූහයේ නිර්මාතෘ සහ අධිපති, බුරුම ශ්වේජින් නිකායේ මහා නායක, අග්ගමහාපණ්ඩිත, අභිධජමහාරට්ඨගුරු, අතිපූජ්‍ය සිතගු ඤාණිස්සර මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ශ්‍රී ලංකාවේ ජනතාව වෙත අත්‍යවශ්‍ය මානුෂීය ආධාර වශයෙන් අමෙරිකානු ඩොලර් දස දහසක මුදලක් මියන්මාරයේ ශ්‍රී ලංකා තානාපති ජානක ප්‍රියන්ත බණ්ඩාර මැතිතුමා වෙත පිරිනමන ලද අවස්ථාව.

# නිදහස් චින්තනය අගය කරන බුදුදහමට විදේශිකයන් කැමැතියි




**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ සයාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ ඉතාලියේ ප්‍රධාන අධිකරණ සංඝනායක ඉතාලියේ බ්‍රෙෂියා බෞද්ධ විහාරාධිපති රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති**

## වතෝගල ධම්මික නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය


**විද්‍යෝදය පිරිවෙනේ වර්ග පටිපාටියෙන් ප්‍රමුඛයාවෙමින් දක්ෂතම ශිෂ්‍යයාට හිමිවන ස්‍යාමරාජ ත්‍යාගය දිනාගෙන ධර්ම ශාස්ත්‍රීය ලෝකයේ නැණ සයුර තරණය කිරීමට පිවිසි ඔබ වහන්සේට කුඩා අවධියේ ගුරු හාමුදුරුවන්ගෙන් ලැබුණු ආභාසය පැහැදිලි කරන්න අපේ හාමුදුරුවනේ,**

යක්කලමුල්ලේ 'වතෝගල' සුන්දර ගම්මානයේ ගැමිකම රකිමින් ඉතාමත් ශ්‍රද්ධා බුද්ධිසම්පන්නව ජීවත්වුණු සැදැහැති මව්පියන්ගෙන් ලැබුණු ආදර්ශවත් ජීවිතය මගේ ජීවිතයට විශාල ආලෝකයක් එක්කළ බව මේ අවස්ථාවේ දී පුණ්‍යානුමෝදනා පූර්වකව සිහිපත් කළ යුතුයි. ඒ ආදරණීය මෑණියන් වගේම සෙනෙහෙබර පියාණන් වචනයේ පරිසමාප්ත්‍යාර්ථයෙන් ම පූර්වාචාර්යවරුන් වුණා. දරුවන්ගේ ජීවිත සුඛිත මුදිත කරන්නට, ගුණ නැණ බෙලෙන් පෝෂණය කරන්නට ගත් උත්සාහයට කෘතවේදී විය යුතුයි.

ඒ වගේම සංසාරේ පුරණ ලද පාරමිතා බලයක් නිසා වෙන්නැති පුංචි කාලයේ සිටම පැවිදිවීමට ආසාවක් ඇති වුණේ. ඒ අනුව වතෝගල ශ්‍රී තපෝධනාරාමාධිපතිව වැඩ සිට අපවත් වී වදාළ රාජකීය පණ්ඩිත, කර්මවාගාචාර්ය කුඹල්ගොඩ සුගුණතිස්ස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආචාර්යත්වයෙන් වතෝගල ධම්මික යන උත්තරීතර ශාසනික නාමයෙන් උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ පැවිදිබව ලබන්නට තරම් පූර්වෝකෘත පුණ්‍යමහිමය බලවත් වුණා.

පැවිදිවීමෙන් අනතුරුව පැවිදි දිවියට ඇවැසි මූලික බණ දහම් වත් පිළිවෙත් ගුරුදේවෝත්තමපාදයන් වහන්සේ සෙවණේ වසර 04 ක් පුරා පුරුදු පුහුණු වෙමින් පිරිවෙන් අධ්‍යාපනය සඳහා ලංකා ශාසනම්බරය ආලෝකවත් කළ දීප්තිමත් පරිවේණාස්ථානයක් වුණු කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනට ඇතුළත් වුණා. දවුල්දෙන ඥාණිස්සර නා හිමි, බෙල්ලන ඥාණවිමල නාහිමි, හෑගොඩ ඛේමානන්ද නා හිමි, තලල්ලේ සේකර නාහිමි, අකුරටියේ අමරවංශ නාහිමි ආදී මහා වියත් පඬිවරුන් ඇසුරේ ධර්ම ශාස්ත්‍රිය ශික්ෂණය ලබා ගත්තා. අග්‍රගණ්‍ය පාණ්ඩිත්‍යයෙන් අත්දැකීම්වලින්, විචක්ෂණ බුද්ධියෙන් පිරිපුන් ධර්ම විනයධර, ශ්‍රද්ධා සම්පන්න ආදර්ශවත් සංඝ නේතෘන් වහන්සේගෙන් ලැබුණු ආභාසය උතුම් පැවිදි ජීවිතයක් ලැබීමට විශාල ශක්තියක් වුණ බවත් කෘතවේදීව ගෞරව පූර්වකව සිහිපත් කළ යුතුයි.

ශාසනානුලෝම් හැඟීමෙන් ශාස්ත්‍රෝන්නකිකාමිත්වයෙන් යුතුව ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් විද්‍යෝදය පිරිවෙනේ අවසාන පරීක්ෂණයට පෙනීසිටීමටත්, ප්‍රථමයෙන් අවසාන ප්‍රථමාංශ පරීක්ෂණ වර්ගයේ සිටියදීම රාජකීය පණ්ඩිත උපාධිය ඉහළින්ම සමත් වුණා. 1986 වර්ෂයේ දී විද්‍යෝදය පිරිවෙනේ දක්ෂතම ශිෂ්‍යයාට හිමිවන ස්‍යාමරාජ ත්‍යාගය ලබා ගැනීමේ ගෞරවයත් ලබා ගත්තා.




එම කාල පරිච්ඡේදයේ දී ම මල්වතු මහා විහාර පාර්ශ්වයේ ශ්‍රීමත් මහානායක මාහිමිපාණන් වහන්සේගේ විශේෂ ප්‍රශංසාවට භාජනය වෙමින් මානම්පිට, ප්‍රියදර්ශනාරාමාධිපතිව වැඩ සිට අපවත් වී වදාළ, ගාලු පළාතේ ප්‍රධාන සංඝනායක, රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති රෑකඩහේනේ චන්ද්‍රජෝති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් සුපරිසුද්ධෝපසම්පදාව ලබා ගැනීමට තරම් භාග්‍යවන්ත වුණා.

1986 වර්ෂයේ දී උසස් අධ්‍යාපනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත්ව පන්ති සාමාර්ථයක් සහිතව ගෞරව ශාස්ත්‍රවේදී උපාධියත්, ශාස්ත්‍රපති උපාධියත් ලබා ගෙන ගාල්ල නාකියාදෙණිය සරණපාල පිරිවෙනේ පරිවේණාචාර්යවරයකු වශයෙන් ගුරුසේවය ආරම්භ කළා. වසර 06කේ ගුරු වෘත්තියේ නියැළෙමින් සිටි කාලපරිච්ඡේදයේ දී ම බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධිය ලබා ගැනීමට කටයුතු කළා.

**බුදුදහමත්, සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි වැනි භාෂා පිළිබඳ දැනුමෙන් පිරිපුන් වියත් පඬිරුවනක් වශයෙන් ඉතාලි බ්‍රෙෂියා විහාරස්ථානය කේන්ද්‍රකොට ගනිමින් දේශිය මෙන්ම විදේශීයව සිදු කරන ධර්ම ශාස්ත්‍රිය හා සමාජීය ප්‍රදනයන් පිළිබඳ සඳහන් කරන්න නායක හාමුදුරුවනේ,**

මම ගුරුවෘත්තියේ යෙදී සිටි කාලයේ තමයි ප්‍රංශයට වැඩම කළේ. ඒ ප්‍රංශයේ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානාධිපති ප්‍රංශයේ ප්‍රධාන සංඝනායක පරවාහැර චන්ද්‍රරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආරාධනාවකට අනුව ප්‍රංශයට වැඩම කරමින් වසර 5 ක කාලයක් ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ ආගමික අධ්‍යාපනික හා සාමාජික කටයුතුවලට නායක ස්වාමීන් වහන්සේට ආධාර උපකාර කළා.

අනතුරුව 2002 වර්ෂයේ සිට 2007 දක්වා ඉතාලියේ වොරෝනා බෞද්ධ මධ්‍යස්ථානයේ ආගමික කටයුතුවල නිරතව සිටිමින් ග්‍රීසියේ ඇතැන්ස් බෞද්ධ විහාරයේ විහාරාධිපති වශයෙන් වසර 03 ක් කටයුතු කළා. ඒ වගේම 2012 වර්ෂයේ සිට වර්තමානය දක්වා ඉතාලියේ බ්‍රෙෂියා බෞද්ධ විහාරයේ විහාරාධිපති ධුරය හොබවමින් වසර 10 කට අධික කාලයක් ඉතාලියේ වැඩ වෙසෙමින් ශ්‍රී ලාංකිකයන්ට වගේම එරට සිටින අනෙකුත් බෞද්ධ ජනතාවට ආගමික අවශ්‍යතා ඉටුකර දීමට ධර්මදූත ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් කැපවීමෙන් කටයුතු කරනවා. ඒ වගේම ධර්ම ශාස්ත්‍රාභිලාභීන්ට ප්‍රයෝජනවත් වන ආකාරයට ග්‍රන්ථ කිහිපයක් රචනා කළා. ඒ අතර පාලි ගාථා ප්‍රබන්ධයක් වූ භක්ති කුසුමාවලී, ව්‍යවහාර සංඛ්‍යා නාම පිළිබඳ සමාජ වාග් විද්‍යාත්මක විග්‍රහය, ජීවිතය සරසන කර්මය හා කර්මඵලය, බුදුන් වහන්සේ වදාළ ශ්‍රද්ධාව, ත්‍රිපිටකයෙන් හෙළිවන බුද්ධ ඥාණ විවරණය ආදී ග්‍රන්ථ කිහිපයක්. බ්‍රෙෂියා විහාරස්ථානයට සම්බන්ධව බ්‍රෙෂියා ශ්‍රී ලංකා ආගමික අධ්‍යාපනික හා සංස්කෘතික සංවිධානය ආරම්භ කරමින් එහි සභාපති වශයෙන් සමාජීය වශයෙන් විශාල කාර්යභාරයක් සිදු කරනවා. ඒ මාර්ගයෙන් ලංකාවේ දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ, වගේම ශිෂ්‍යයත්ව ලබා දෙනවා. දුප්පත් ජනතාවට වියළි ආහාර, ගැබිනි මව්වරුන්ට ආධාර උපකාර, රෝහල් සඳහා වෛද්‍ය උපකරණ පරිත්‍යාග කරනවා. ඊට අමතරව එක්සත් සුබ සාධක සංගමයේ අනුශාසක වශයෙන් සමාජ, සංස්කෘතික පොදු වැඩවලදී සහයෝගය උපරිමයෙන්ම ලබා දෙනවා.

විදේශීය ධර්ම දූත ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් සිදුකරන ලෝක ආගමික සේවය සම්භාවනාවට පාත්‍ර කරමින් සයාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රධාන සානුනායක කාරක සංඝ සභාව විසින් සද්ධර්මකීර්ති ශ්‍රී සෝභිත සුගුණතිස්ස යන ගෞරව නාමය සහිතව සයාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ ඉතාලියේ ප්‍රධාන අධිකරණ සංඝනායක ධූරය පිරිනැමීමට කටයුතු කළා.

**බහුශ්‍රැත පඬිරුවනක් වශයෙන් කීර්තිධර ඔබ වහන්සේ නූතන ලංකාවේ බුදු දහමේ ව්‍යාප්තිය පිළිබඳ දරන ආකල්පය කෙබඳුදැයි පැහැදිලි කරමින් සාකච්ඡාව අවසන් කරමු නායක හාමුදුරුවනේ,**

අපේ රටට වඩා යුරෝපීය ජාතිකයන් බුදු දහම ගැඹුරින් අධ්‍යයනය කරනවා. බුදුදහම හොඳට කියවා, ප්‍රගුණ කරමින් ප්‍රායෝගිකව භාවනාවට යොමුවෙනවා. බුදුරජාණන් වහන්සේගේ මානව ගුණයට, නිදහස් චින්තනයට බොහෝ සේ ගරු කරනවා. ඔවුන් ආගම වැළඳ ගත්තේ නැතත්, කියවා ඉගෙන ගන්නවා. තවදුරටත් හදාරනවා චතුරාර්ය සත්‍ය පිළිබඳ පොත් පත් කියවා එම කරුණු තවදුරටත් පැහැදිලි කරගන්න කරුණු විමසනවා. බුදුදහම අවිහිංසාව නිදහස් චින්තනය අගය කරන ආගමක් නිසා විදේශිකයන් බුදු දහමට බොහෝ කැමැතියි. භාවනා ක්‍රම පුහුණු කරන භාවනා මධ්‍යස්ථාන තිබෙනවා. ලංකාවේ පරිසරයට වඩා බොහොම වෙනස් ස්වභාවයක් ඒ රටවල තිබෙන්නේ. ඉතාලි සමාජය වර්තමානය වන විට වහ වහා බුදුදහම වැළඳගන්න ස්වභාවයක් තිබෙනවා. බුදුදහම කෙරේ විශාල ඉල්ලුමක් තිබෙනවා. සොර සතුරු බිය, පළිගැනීම්, වෛරකිරීම්, අවිශ්වාස කිරීම් ඒ රටවල නැහැ.

හේමමාලා රන්දුනු

## දැමුණු සිතින්

අලව් නුවර යක් විමනට - සම්බුදු හිමි වැඩම කළා
යක් මැදුරේ නඩු විසඳන - මහ අසුනේ වැඩ සිටියා
ඒකයැ, යක් සෙන්පතියනි - අප පාලන කරන පුටුවෙ
ශ්‍රමණ කෙනෙක් වාඩිවෙලා - යකෙක් කියයි ගත වෙවුලා

කලබල වුණු අලව් යකුව - පවනට බඳු වේගයෙන්ම
ගල්, මුල්, වලවල් නොතකා - භවන සොයා දිව යනවා

පලයං ඔතනින් එළියට - නැවතත් ඇතුළටම වරෙන්
මහ හයියෙන් අඩි හප්පා - කෑගසමින් අණ දෙනවා

පළමු දෙවැනි තෙවැනි වරත් - එළියට ඇතුළට වැඩියා
නිහඬ ව සන්සුන් ගමනින් - අවනත බව පෙන්වූවා

සිව්වන වර අණ ලැබුණා - බුදුහිමි අසුනෙම උන්නා
හැකි දෙය දැන් කරන්න හැකි - යකුට අවස්ථා දුන්නා

පරපුරෙ අපෙ මහ යක්කු - රැකගෙන ආ පැනයක් වූ
විසඳාලනු බැරි නරහට - මරණය උරුමය අත් වූ

හත්කඩකට ඔළුව පලා - පර සක්වල ගලෙන් එහා
විසි කළ හැකි ජව පෙන්නා - උද්දාමෙන් උඩ පැන්නා

ඇසු ඇසු හැම පැනයට බුදුහිමි පිළිතුරු දුන්නා
දහම් පිපාසය ඇති වී - තෙරුවන් වෙත ළං වෙනවා

නම්‍යශීලී වන ගුණයත් - හැම දෙනාට කන්දීමත්
යකු දමනය අප සිත් ගත් - දෙන පාඩම හරි වැදගත්

**ශාස්ත්‍රපති වැලිපත පඤ්ඤානන්ද හිමි**
**දම්වැල්ඔඩය රාජමහා විහාරය - කොටවෙහෙරමංකඩ**

## පහන් සිතක කවි



සංස්කරණය
දීපා පෙරේරා

### ගමන

බුදු ගුණ නිතර නිතරම සිහි          කරන්නට
දෙසු දහමින් සිතට සැනසුම          ලබන්නට
සඟ ගුණ අපේ ජීවිතයට ළං          වන්නට
වඳිනෙමි සදා තෙරුවන් ගුණ          මුල්තැනට

මිනිසකු විලස මිහිපිට අප          ඉපදෙන්ට
කොතරම් පිනක් ඇත්දැයි යහපත්          ලෙසට
පස් පව්වලින් ජීවිතයට          මුදවන්ට
අදිටන් කර ගනිමු බුදු ගුණ මෙනෙහි          කොට

ලැබුණු ජීවිතෙන් හරි හැටි වැඩ          ගන්ට
කොපමණ දෙනා දැයි යන්නේ හරි          මඟට
පස් පව් නොකර මතු සසරේ          ජය ගන්ට
පැතුම් පතම් මතු භවයෙ දී          ඉපදෙන්ට

ඉපදෙන විටදි අප ගෙන ආදේ          නැත්තේ
කළ හොඳ නොහොඳ බව සැමදෙන දත          යුත්තේ
මොහොතින් මොහොත මරණෙට ළං වනු          ඇත්තේ
ආගම දහමටයි ජීවත් විය          යුත්තේ

**වයලට් ජයසිංහ**



### නිකිණි පෝයදා

සමයක් නිසා වැසි වැඩි මතු තුන්          මාසේ
රුක්මුල් අසල ඇතිවන සීතල          දැඩි සේ
අපහසු නිසා කරනට බණදම්          රිසි සේ
එකතැන විසීමට දුන්නා          උපදේසේ

පෙරවස් වසන්නට තිබුණත් පෝයට          ඇසළ
මඟහැරුනොතින් සඟරුවනට ලැබුමට          සීල
පසුවස් වසන්නට පොහෝ දින          විසුල
නිකිණි පෝය දා සිදුවෙයි විලසින්          පතළ

ලලාට ධාතූන් වහන්සේ          සම්බුදුහිමියන්ගේ
තැන්පත් කරවන්න මත්තෙහි ලක්          මවගේ
ඉදිකරවන්න සේරුවාවිල වෙහෙර          අගේ
වැඩ ඇරඹුණේ නිකිණි පොහෝදා ඈත          යුගේ

දෙසු දම් සයුර අපෙ සම්මා සම්බුදු          හිමි
මතකයෙ තබා ගත් මැනවින් නැතුව          නිමි
ලැබුවේ රහත් භාවය බිඳ සසර          බැමි
නිකිණි පෝයදා මහ ආනන්ද          හිමි


ගෞතම බුදුන්ගේ මහ          පරිනිර්වාණෙන්
තෙමසක් ගෙවුණු දා මහ කසුප්          තෙරුන්
මුල්තැන අරන් අජාසත් රජු          අනුබලෙන්
නිකිණි පෝය දා කළේ සංගායනේ          මුලින්

සම්බුදු සමිඳු වැඩ සිටියදි දෙව්රම්          වෙහෙර
එළඹුණු වස් සමයෙ එකුන් පසළොස්          වසර
අසා බුදුන්ගෙන් රාහුල හිමි රාහුල          සුතුර
ලැබුවේ රහත්භාවය පොහොදා          නිකිණි පුර

දළදා සමිඳුට පුදමින් බොදු          උපහාර
කරනා උතුම් පෙරහර මංගල්ලේ          මෙවර
සෙංකඩගල වීදි සරන අවසන් රන්දෝලි          පෙරහර
දිනේ උතුම් පුන් පොහොදා          නිකිණි පුර

**ඒ.එම්.අබේසිංහබණ්ඩා**
**මාපනාවතුර**
**මහනුවර**

## පිය සෙනෙහස



දස මාසයක් මා කුසයේ          නොදැරුවට
ඔබෙ සෙනෙහසේ අඩුවක්          නොදැනුණා මට
පිය සෙනෙහසට කවි මල් දම්          ගොතන්නට
නමදිමි ඔබෙ දෙපා පෙර මෙන්          අදත් හෙට

දරුවන් හොඳින් ලොව ජීවත්          කරවන්න
ඔබ විඳි ගැහැට බෑ වචනෙන්          පවසන්න
අප නෙත් පාදවා දිවිමඟ රැක          ගන්න
ඔබ ඉවසුවා හැමදාමත් කුස          ගින්න

ජීවත් වෙන්න කොපමණ කළමුත්          යුද්දේ
ඔබෙ ජීවිතේ තිබුණේ නෑ බොරු          සද්දේ
ඇතමුත් ගැරහුවත් ඔබ හට නිව          රැද්දේ
ඔබ නම් ඔවුන්ගේ නෑ කකුළෙන්          ඇද්දේ

දරුවොත් හදා දරුමුණුපුරණුත්          රැකලා
බිරිඳට ගම රටට යුතුකම් ඉටු          කරලා
ඔබෙ ජීවිතේ හැට හය වසරක්          ගෙවලා
කුමටද? ඔබ ගියේ ගිහි ගෙය          කළකිරිලා

දැවටුණ දා පටන් සිරුරේ          කසාවත
සසුනට ඔබෙන් වරදක් නම් වුණේ          නැත
තද කරගෙන සිටි නමුදු ඔබගේ සෙනේ          සිත
දරු පෙම කියා පෑවා ඔබෙ නීල          නෙත

නිසසල නිසලවිල පින්බිම          තුඹුල්ලේ
දැහැමින් සෙමෙන් කල් ගෙව්වා          නිදැල්ලේ
අප නොපැතූ විලස එළිවෙන          ඇසිල්ලේ
ඔබ සැනසුණානේ මරුවගෙ          තුරුල්ලේ

**ජේ.ඩබ්ලිව්. ඉන්ද්‍රානි රම්‍යලතා**

### සසුනඹරේ සඳ



හිස මුඩුකර ගත කසාවතක් හැඳ
සන්සුන් ගමනින් පා තබනා
මා කුසහොත් පුත නුඹ මට ඈතයි
ගව්ගණනක් දුර ඈත් වෙලා
සිතට දැනෙන දුක ඉහළ ගොසින් අද
සක්විති රජකම උරුම වෙලා
නෙතගේ කඳුළැලි දෝරෙ ගලා යයි
සසුනඹරේ සඳ එළිය වෙලා
දුව පැන හැම තැන බත් ගුලි කර කැව්
සුරතින් රස කරලා
ගෙපැලෙහි ඉදෙනා දනක් පුදන්නට
වඩිනු මැනවි කුළුණින් හිතලා

**ගයානි කේ. වරකාගොඩ**
**රත්නපුර**



බුදුසරණ
## පහන් සිතක කවි

BCC

සම්පූර්ණ නම :- ..........................................................
ලිපිනය :- ..........................................................
දුරකථන අංකය :- ..........................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක
සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.
ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.
සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.

## දුටුගැමුණු මහ රජතුමා

80 කොටස

# එළාර රජුගේ යුද සැලසුමේ වෙනසක්

**බෝධිනාග, රජුට ආචාර කර ශාලාවෙන් පිටතට ආවේ ය. අසුපිට නගින්නට සූදානම් වන විටදීම දූතයකු පැමිණ සියලු දෙනාටම රජ මාළිගයට යන ලෙස රජතුමා දන්වා සිටින බව කිවේ ය. බෝධිනාගට ද එම ආරාධනය විය. රජ මාලිගයට ගිය බෝධිනාගට දැන ගන්නට ලැබුණේ සිරිනාග වෙනුවෙන් පවත්වන සම්මාන උළෙල උත්සවාකාරයෙන් පැවැත්වීමට රජතුමා තීරණය කළ බව ය.**

"සිරිනාග තොපට ලැබී ඇති හසුන්පත පෞද්ගලික එකක්ද? නැතිනම් එය අපටත් ප්‍රයෝජනවත් එකක් දැයි දැනගන්නට කැමතියි."

"දේවයන් වහන්ස. එය රහස් තල්පතක්. අපට වැඩදායක එකක්. නමුත් එය අපේ හිතට සැනසුමක් දෙන ආරංචියක් නම් නොවෙයි. කියමින් ඔහු එය දීඝජන්තු අතට පත් කළේ ය.

"සෙන්පති, එය මුළු සභාවටම ඇසෙන්න කියවන්න.

එය කියවා බැලූ දීඝජන්තුගේ මුහුණ අඳුරු වනු කාටත් පෙනිණි. රජතුමා දෙස බලා තල්පත කියවීය.

"ගැමුණු මහ රජතුමා යුද සැලැස්ම වෙනස් කළා. විජිතපුර බලකොටුවෙන් නන්දිමිත්‍ර මහ සෙන්පතිතුමාට ලැබුණ රහස් ලිපියකින් අනුරාධපුර රාජ සභාවේ දී ගත් තීරණ දන්වා එවා තිබුණා. ඒ නිසා මුලින් ම කරන්නේ මහවැලි දකුණු ඉවුරේ සියලුම බලකොටු බිඳ දැමීමයි. විජිතපුර බලකොටුවට ඉතාම ළඟ තැනකින් අනුරාධපුර රාජධානියට ඇතුළුවේවි. දිගටම ඔත්තු සැපයීම අසීරු වේවි. නන්දිමිත්‍රගේ සේනාංකයේ අලුතෙන් පුහුණු කළ සේනාංකයක් සමඟ අපි අද මහියංගනය බලා පිටත් වෙනවා."

සභාව නිහඬ විය. සැමගේ ම ඇස් යොමුවූයේ දීඝාභය සහ උපතිස්ස දෙසට ය. ඔවුන් දෙදෙනා ද පුදුමයෙන් බලා සිටියහ. දීඝාභයගේ උකුසු ඇස් තමන් වෙත යොමු වී තිබෙන බව දුටු සිරිනාග යමක් කියන්නට උත්සාහ කළේය. එහෙත් ඊට ඉඩ නොතබා දීඝාභය ප්‍රශ්න කළේ ය.

"සිරිනාග තොපට මේ තල්පත එවා තිබෙන්නේ කවුරුන්ද?"

"මට සේවය කරන සෙනෙවියෙක්"

මේ තල්පත ලැබුණේ කෙසේද?

පරෙවියකුගේ මාර්ගයෙන්.

"එවා තිබෙන්නේ කොහෙන්ද?"

"මැදගම උයන්තොටින්"

"තොප කියන්නේ දුටුගැමුණු රජතුමා මහියංගනයට පැමිණ සිටින බව ද?"

"නැහැ මහියංගනයට පැමිණෙමින් සිටින බවයි."

"තොපගේ පරෙවියා බොහෝම දක්ෂයි."

"ඔව් මහ සෙනෙවිතුමනි. අද මගේ පරෙවි දූතයා මහියංගනයේ. එම සේවය ලබා ගන්නට බැරි වූ දිනයක දී හීපත් මඟින් තොරතුරු ලබා ගන්නවා."

"දීඝාභය තර්ක කරන්නට අවශ්‍ය නැහැ. අපට දැන ගන්නට ලැබුණු දේ සත්‍යයක් නම් ඉදිරියේ දී මෙවැනි දේ නොවන්නට වග බලා ගත යුතුයි."

"දේවයන් වහන්ස, රාජ සභාවේ කිසිවකු මේ ගැන සැක කරන්නේ නැහැ. මෙතැන සිටින සෑම කෙනෙක්ම රහස් රකින බවට අපට විශ්වාසයි. නමුත් රහස් රැකීම ගැන වැඩි සැලකිල්ලක් නැති කෙනකුගෙන් ගෙදර දොරේ කතාබහක දී වුණත් මේ රහස් පිටවෙන්න පුළුවන්. ඒ නිසා රහස් රැකීමේ ප්‍රඥප්තියක් මේ රාජ සභාව තුළ ඇති කර ගන්නට ඕනෑ."

"ඔව්, තොපගේ අදහස මා පිළිගන්නවා. නමුත් දැන් අපේ සියලු සැලසුම් වෙනස් වෙනවා. නව යුද සැලසුමක් පිළියෙළ කරන්නට වේවි."

"අද හවස අමාත්‍ය මණ්ඩලය රැස් වෙනවා. දීඝාභය, දීඝජන්තු, සිරිනාග එහිදී මහ ඇමැති හමුවිය යුතුයි. දීඝාභය, දීඝජන්තු හෙට දහවල් මා හමුවන්නට ඕනෑ. සිරිනාග හැකි ඉක්මණින් සවිස්තර වාර්තාවක් මා වෙත ඉදිරිපත් කරන්නට ඕනෑ.

"සියලුම යුද්ධ මණ්ඩල රැස්වීම් සති කිහිපයකට කල් දමන්න. සියලුම සේනාංකවල යුද්ධ අභ්‍යාස කරගෙන යන්න. සියලු සෙබලුන් සීරුවෙන් තබන්න. දුටුගැමුණු යුද්ධය ආරම්භ කිරීමට පෙර අපි ඔහු හමුවට යන්නට ඕනෑ."

රජතුමාගේ මුහුණ අඳුරු විය. කැළඹුණු සිතින් යුතුව නැඟී සිටියේ ය. ඔහු කිසිවකු දෙස නොබලා සම්මන්ත්‍රණ ශාලාවෙන් පිට විය. සැවොම පුදුමයෙන් බලා සිටියහ.

සෙනෙවිවරු සිරිනාග වටකර ගත්හ. "අපට මේ යුද්ධය ජය ගන්නට නම් දුටුගැමුණු රජු සිටින තැන නිශ්චිතවම දැන ගන්නට ඕනෑ. එසේ නොවුණොත් සතුරාට හසු වී මියැදෙන්නට අපට සිදුවේවි."

"සිරිනාග දැන් රජ මාලිගයට යමු. රාජකීය අමුත්තෝ සියලු දෙනාම දැන් රාජමාලිගයට පිටත්ව ගොස් තිබෙනවා. මෙවැනි අවුල් සහගත තත්ත්වයක් රජතුමා බලාපොරොත්තු වුණේ නැහැ.

"කාරණය ඉතාමත් බැරෑරුම් තමයි. මින් පසුව අපට ලැබෙන රහස් පත් අපි කිහිපදෙනකුට පමණක් සීමා කර ගනිමු. රජතුමාගේ අනුමැතියෙන් ගන්නා තීරණ පමණක් යුද්ධ මණ්ඩලයට දැනුම් දෙමු."

"ඔව්, එසේ සිදු කිරීම වඩාත් හොඳයි. විජිතපුර බලකොටුවේ සේනාංක විසුරුවා හැර තුණ්ඩිල යටතේ නව සේනාංකයක් පත් කරන ලෙස මම රජතුමාගෙන් ඉල්ලා සිටිනවා."

"ඔව්, ඒ අදහස හොඳයි. නමුත් ඉක්මන් නොවී හෙමින් සීරුවේ තීරණ ගනිමු. කිසිවකුගේ සිත් නොරිදෙන ලෙස තීරණ ගනිමු."

"සිරිනාගට පිදෙන උපහාරය ගැනත් විවිධ ආකල්ප ඇති. ඒත් අපේ රජතුමා දක්ෂ අවංක නිලධාරීන්ට කැමතියි."

"මහ සෙනෙවිතුමනි, මට නම් දැන් කාලයක සිටම පවතින්නේ කළකිරීමක්. ඒ නිසායි මම සම්මාන පරිත්‍යාග පිරිනැමීම ප්‍රතික්ෂේප කළේ."

"ඔව් සිරිනාග, රජතුමා ඔබ කෙරෙහි විශාල පැහැදීමකින් සිටින්නේ. ජයනාථ සිටුතුමා කැමති කරවා ගැනීම අප ලැබූ ජයග්‍රහණයක්. කුණ්ඩල බ්‍රාහ්මණතුමාත් අපේ පැත්තට හරවා ගන්න පුළුවන් නම් ලොකු වාසියක්."

"අද රාජ සභාවට පැමිණි සියලු දෙනාටම දිවා භෝජනය රාජ මාලිගයෙන්. සිරිනාගට රන් කහවණු විසි දහසක් දෙන්නට රජතුමා තීරණය කළා. දැන් අපි යමු." සියලු කටයුතු පැය දෙකකින් පමණ අවසන් කිරීමටයි. රජතුමාගේ අදහස.

අයන්ති විතාන

